# ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය

## ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය සහ රැකියා වියුක්තිය

## 2009 – තෙවන කාර්තුව

(සටහන : උතුරු පළාත ආවරණය නොවුණි)

# රැකියා නියුක්ති ජනගහන ව්‍යාප්තිය
# ප්‍රධාන කර්මාන්ත අනුව – 2009 තෙවන කාර්තුව
## (උතුරු පළාත හැර)




- 2009 තෙවන කාර්තුව තුල වාර්තා වූ රැකියා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව දස ලක්ෂ 7.6 ක් පමණ වේ.
- කෘෂිකාර්මික අංශයේ මෙම ප්‍රතිශතය 32% කි.
- කර්මාන්ත අංශයේ රැකියා කරන්නවුන් වාර්තා වන්නේ 25% ක් වැනි ප්‍රතිශතයකි.
- රැකියා නියුක්ත වූවන් ගෙන් සේවා අංශයන්ට සම්බන්ධ රැකියාවල යෙදෙන්නන්ගේ ප්‍රතිශතය 43% කි.

## වගුව 1 : ප්‍රධාන කර්මාන්ත අනුව රැකියා නියුක්ති ජනගහනයේ ව්‍යාප්තිය – 2009 තෙවන කාර්තුව හා 2008 තෙවන කාර්තුව සංසන්දනාත්මකව (උතුරු පළාත හැර)

| වර්ෂය | කෘෂිකාර්මික | කර්මාන්ත | සේවා | එකතුව |
|---|---|---|---|---|
| ජූලි.–අගෝ.–සැප්.– **2008 -** (3 වැනි කාර්තුව) | 2,666,000 (34%) | 2,001,000 (26%) | 3,069,000 (40%) | 7,735,000 (100%) |
| ජූලි.–අගෝ.–සැප්.– **2009 -** (3 වැනි කාර්තුව) | 2,426,000 (32%) | 1,912,000 (25%) | 3,303,000 (43%) | 7,642,000 (100%) |
| **2009** කා.3 **-2008** කා.3 | -240,000 | -89,000 | 234,000 | -93,000 |

# ප්‍රධාන කර්මාන්ත අනුව රැකියා නියුක්ති ජනගහනය – 2000 සිට 2009 තෙවන කාර්තුව දක්වා (උතුරු හා නැගෙනහිර පළාත හැර)




* 2009 පළමු කාර්තු තුන පදනම්ව

# විරැකියාව – 2009 තෙවන කාර්තුව
## (උතුරු පළාත හැර)

- 2009 තෙවන කාර්තුව තුලදී රැකියා විරහිත පුද්ගලයින් සංඛ්‍යාව 480,000 ක් පමණවේ. 2008 තෙවන කාර්තුවේදී මෙම අගය 449,000 කි.
- 2009 තෙවන කාර්තුව තුල වාර්තා වූ විරැකියා අනුපාතය 5.9% කි. 2008 තෙවන කාර්තුවේදී මෙම අගය 5.5 කි.
- 2008 වර්ෂය තුල රැකියා වියුක්තිය 433,000 කි.
- 2009 වර්ෂයේ පළමු කාර්තු තුන තුල රැකියා වියුක්තිය 475,000 කි.

## විරැකියා අනුපාතය : 2003 – 2009 කා.3

(උතුරු හා නැගෙනහිර පළාත් හැර)




* 2009 පළමු කාර්තු තුන පදනම්ව

- කෙසේ නමුත් වාර්ෂික විරැකියා අනුපාතයන් සැලකූවිට, 2003 සිට 2008 වසර දක්වා ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කරන අතර 2009 (2009 පළමු කාර්තු තුන පදනම්ව) තුලදී 2008 ට සාපේක්ෂව එහි වැඩිවීමක් පෙන්නුම් කරයි.